# ප්‍රසම්පාදන දැන්වීමයි

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව පළාත

## ජාතික තරඟකාරිත්ව මිල ගණන් කැඳවීම.

01. පහත සඳහන් වැඩ විෂය සඳහා රත්නපුර ගැටන්ගම පිහිටි පළාත් අධ්‍යාපන කාර්යාලයේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2024.10.21 වන දින දක්වා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් වෙන් වෙන් වශයෙන් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | විධායක ඉංජිනේරු බල ප්‍රදේශය | වැඩ විෂයය | කොන්ත්‍රාත් තුවේ ඇස්තමේන්තුගත වැඩ වටිනාකම (රු. මිලි.) | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ලංසු බැඳුම්කරයේ වටිනාකම (රු.) | ලියාපදිංචි ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| 01 | කෑගල්ල | කෑ/ශාන්ත මරියා විද්‍යාලය පුස්තකාලය සහිත තාක්ෂණ විද්‍යාගාරය ඉදිකිරීම (ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම.) | 3.74 | 2,500.00 | 38,000.00 | C8 – C7 |
| 02 | කෑගල්ල | කෑ/ශාන්ත මරියා විද්‍යාලයේ 75*40 දෙමහල් තාක්ෂණ විද්‍යාගාරය ඉදි කිරීම (ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම). | 2.89 | 2,500.00 | 29,000.00 | C8 – C7 |
| 03 | ඇඹිලිපිටිය | ර/ඇඹි/කොලොන්න ජාතික පාසලේ තෙමහල් පන්ති කාමර සහිත පරිපාලන ගොඩනැල්ල ඉදි කිරීම (ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම). | 10.29 | 4,000.00 | 103,000.00 | C6 – C5 |
| 04 | බලංගොඩ | ර/මැද්දෙකන්ද දෙමළ විද්‍යාලයේ 90*25 දෙමහල් ගොඩනැගිල්ල ඉදකිරීම අදියර (II ) ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම. | 2.46 | 2,500.00 | 25,000.00 | C8 – C7 |
| 05 | බලංගොඩ | ර/සිසිල්ටන් දෙමළ විද්‍යාලයේ 90*25 දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම(කාර්යාලය සහ පුස්තකාලය සහිත ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම) | 9.52 | 3,500.00 | 96,000.00 | C7 – C6 |
| 06 | කෑගල්ල | දැදිගම පැරකුම්බා මහා විද්‍යාලයේ තෙමහල් තාක්ෂණ විද්‍යාපීය ගොඩනැගිල්ල ඉදිකිරීම (ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම) | 14.54 | 5,000.00 | 146,000.00 | C6 – C5 |
| 07 | කෑගල්ල | කෑ/ගලිගමුව මහා විද්‍යාලයේ තෙමහල් තාක්ෂණ විද්‍යාපීය ගොඩනැගිල්ල ඉදිකිරීම (ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම) | 8.41 | 3,500.00 | 85,000.00 | C7 – C6 |
| 08 | බලංගොඩ | බලන්ගොඩ ආනන්ද මෛත්‍රී ජාතික පාසල සාමාන්‍ය පෙළ විද්‍යාගාරය ප්‍රතිසංස්කරණය කිරීම. | 3.77 | 2,500.00 | 38,000.00 | C8 – C7 |
| 09 | පැල්මඩුල්ල | ර/ගන්කන්ද ජාතික පාසල අත්‍යාවශ්‍ය ගොඩනැගිලි අලුත්වැඩියා | 3.27 | 2,500.00 | 33,000.00 | C8 – C7 |
| 10 | කෑගල්ල | කෑ/තෝලංගමුව ඩඩ්ලි සේනානායක මහා විද්‍යාලය 120*20 ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීම. | 2.54 | 2,500.00 | 26,000.00 | C8 – C7 |
| 11 | රත්නපුර | ර/ඇහැළියගොඩ මධ්‍ය මහා විද්‍යාලයේ තාක්ෂණ විද්‍යාගාරය අලුත්වැඩියා කිරීම | 1.49 | 1,000.00 | 15,000.00 | C9 – C8 |
| 12 | ඇඹිලිපිටිය | ර/එග්බර්ත් දෙමළ විද්‍යාලය ක්‍රීඩා පිටිය වැඩිදියුණු කිරීම ආශ්‍රිත වැඩ (ඉතිරි වැඩ) | 5.55 | 2,500.00 | 56,000.00 | C7 – C6 |

| අනු අංකය | විධායක ඉංජිනේරු බල ප්‍රදේශය | වැඩ විෂයය | කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තුගත වැඩ වටිනාකම (රු. මිලි.) | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ලංසු බැඳුම්කරයේ වටිනාකම (රු.) | ලියාපදිංචි ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| 13 | ඇඹිලිපිටිය | ර/එග්බර්ත් දෙමළ විද්‍යාලය රුඳවුම් බැම්ම, මායිම් තාප්පය සහ චේන් ලින්ක් වැට ඉදිකිරීම සහ ප්‍රධාන පිවිසුම සහ වැසි ජලය බැහැර කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම | 5.69 | 2,500.00 | 57,000.00 | C7 – C6 |
| 14 | පැල්මඩුල්ල | ර/ස්ප්‍රිංවුඩ් දෙමළ විද්‍යාලය, රක්වාන 60*20 තනිමහල් ගොඩනැගිල්ල දීර්ඝ කිරීම සහ අලුත්වැඩියා කිරීම (ඉතිරි වැඩ) ,මායිම් තාප්පය, චේන් ලින්ක් වැඩ තාප්පය සහිතව ඉදිකිරීම. | 8.30 | 3,500.00 | 84,000.00 | C7 – C6 |
| 15 | කෑගල්ල | කෑ/ශාන්ත ජෝශප් බාලිකා විද්‍යාලය වහල අලුත්වැඩියා කිරීම | 6.03 | 2,500.00 | 61,000.00 | C7 – C6 |

02. මෙම ලංසු කැඳවීම ජාතික තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය යටතේ සිදු කරනු ලබන අතර, මෙම කර්මාන්තයේ ඇස්තමේන්තු වටිනාකම රු. මි. 50ට වඩා අඩු බැවින් රාජ්‍ය මුදල් චක්‍රලේක අංක 04/2016 (ii), 04/2016 (iii) අනුව **<u>ප්‍රාදේශීය ප්‍රමුඛතා හා අදාල CIDA ශ්‍රේණිගත ප්‍රමුඛතාවය හෝ සබරගමුව පළාත් ඉදිකිරීම් කොන්ත්‍රාත් ලියාපදිංචිය</u>** පදනම් කරගනිමින් ලංසුකරුවන් තෝරා ගැනිම සිදුකරනු ලැබේ. චක්‍රලේඛයට අදාලව පසුව නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 01/2024 යන චක්‍රලේඛය ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාල වේ.

03. වැඩ විෂයට අදාල ලංසුපත් 2024.10.01 දින සිට 2024.10.20 දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.30 සිට ප.ව. 3.00 දක්වා ඉහත සඳහන් පරිදි ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු ගෙවීමෙන් රත්නපුර, ගැටන්ගම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ (ගොඩනැගිලි අංශය) විසින් ලබා ගත හැක.

04. ඒ සඳහා ඉහත 1 වගුවේ (5 වන තීරුව) සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තු 09.00 පැය හා 15.00 පැය අතර කාලය තුල සබරගමුව පළාත් අධ්‍යාපන කාර්යාලයේ සරප් වෙතින් ලබාගත් ලදුපත ඉදිරිපත් කර ලංසු ලබාගත යුතුය. ගෙවීම් මුදලින්ම කල යුතු වේ.

05. ඉහත ඉදිකිරීම් පිළිබඳ අවශ්‍ය විස්තර පළාත් අධ්‍යාපන කාර්යාලයේ (ගොඩනැගිලි අංශය) වෙතින් හෝ පළාත් ඉංජිනේරු සේවා කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරු (පාසල් ගොඩනැගිලි) වෙතින් ලබා ගත හැකිය.

**පළාත් අධ්‍යාපන කාර්යාලය (ගොඩනැගිලි අංශය) - 045 2230037**
**ප්‍රධාන ඉංජිනේරු (පාසල් ගොඩනැගිලි) - 045 2226618**

06. සාර්ථක ලංසුකරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම ඔවුන්ගේ ICTAD ලියාපදිංචි වටිනාකමට සීමාකරනු ඇත. ලංසු සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාරගැනීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07.ලංසු පිටපත් දෙකකින් යුතුව 2024.10.21 දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ පළාත් අධ්‍යාපන කාර්යාලයේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ තබා ඇති මුද්‍රා තබන ලද ටෙන්ඩර් පෙට්ටියට ගෙනැවිත් බහාලීමෙන් හෝ සභාපති, පළාත් අධ්‍යාපන කාර්යාලයේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලය,ගැටන්ගම,රත්නපුර නමට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් ඉදිරිපත් කළ හැකිය. මුල් ලංසුපත හා පිටපත කවරවල බහා වෙන් වෙන්ව මුද්‍රා කර නැවත එක් කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය. ලංසු පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාළ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය.

08. සියලුම ලංසුකරුවන් එක් එක් ඉදිකිරීම් සඳහා එම කර්මාන්ත ඉදිරියෙන් සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි පිළිගත් වාණිජ බැංකුවකින් **2024.10.21 දින සිට 2025.02.21 දක්වා** වලංගුවන පරිදි **පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන කාර්යාලය, ගැටන්ගම, රත්නපුර** නමින් අදාල කර්මාන්තය නමට ලබාගත් ලංසු බැඳුම්කරයක් හෝ ලංසු සුරක්ෂණ මුදල ලෙස **"පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ" නමින් අදාළ මුදල් තැන්පත් කර ලබාගත් රිසිට් පත ලංසුව සමඟ බැඳුම්කරය ලෙස ඉදිරිපත් කළ යුතුය. ලංසු බැඳුම්කරය ඉදිරිපත් කිරීමේදී මුදල් ගෙවා ලබාගන්නා රිසිට් පතෙහි හෝ ලංසු සුරක්ෂණයෙහි මුල් පිටපත අනිවාර්යෙන්ම ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කළ යුතුය.** සියළුම ලංසු **2025.01.21 දින දක්වා** වලංගු විය යුතුය.

09. **2024.10.21 දින පෙ.ව. 10.30 ට ලංසු භාර ගැනීම අවසන් වූ වහාම** පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි අංශයේ දී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේ දී ලංසු විවෘත කරනු ලබනවා ඇත. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

සභාපති,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ගැටන්ගම, රත්නපුර.
2024.10.01 දින.